# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 257/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 12/02/2024<br>පැය 1840 |

**මාධ්‍ය නිවේදනය**

**සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී වෙඩි වැදී මිය ගිය පොලිස් සැරයන් ශ්‍රියන්ත නිලධාරියා උප පොලිස් පරීක්ෂක නිලයට උසස් කිරීම - පොලිස් මූලස්ථානය.**

2024.02.09 වන දින මල්වතුහිරිපිටිය පොලිස් වසමේ බටපොල ප්‍රදේශයේදී රාත්‍රි කාලයේ මාර්ගයේ ගමන් කරමින් තිබූ ත්‍රීරෝද රථයක සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටියදී සැකකරුගේ ශාරීරික අවශතාවයක් ඉටුකර ගැනීමට අවස්තාව ලබාදී නැවත ජීප් රථයට නංවා ගැනීමට කටයුතු කර ඇත. එහිදී සැකකරු ප්‍රතිරෝධය පෑමක් සිදුර ඇති අතර සැකකරු හා පොලිස් නිලධාරීන් තිදෙනා අතර සිදු වූ පොර බැදීමකදී සැකකරු විසින් පොලිස් සැරයන් ශ්‍රියන්ත නිලධාරියා අත තිබූ ගිනි අවියයෙන් වෙඩි තැබීමක් සිදු කිරීම හේතුවෙන් බර පතල තුවාල ලැබූ පොලිස් සැරයන්වරයා ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල ඇතුලත් කරන ලදී.

මෙම නිලධාරියා ප්‍රතිකාර ලබමින් සිටියදී 2024.02.11 වන දින මියගිය අතර රාජකාරි අතරතුර සිදු වූ අනතුරකින් මෙම නිලධාරියා මියගොස් තිබෙන බැවින් පශ්චාත් උසස්වීම් ලබාදීමේ පදනම යටතේ පොලිස්පතිතුමා විසින් ඔහුව වහාම ක්‍රියාත්මක වන පරිදි උප පොලිස් පරීක්ෂක තනතුරට උසස් කරන ලදී. තවද නිලධාරියා වෙනුවෙන් ඔහුගේ පවුලේ සාමාජිකයන් හට පොලිස් ත්‍යාග අරමුදලෙන් රුපියල් ලක්ෂ දහයක මුදලක් (රුපියල් 1,000,000/=) ලබාදීම සඳහා ද පොලිස්පතිතුමා විසින් අනුමැතිය ලබාදී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**